# මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට අනුයුක්ත ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටිය

## 1. හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2022.12.14 දිනැති අංක 2310/29 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 251 වගන්තියේ විධිවිධාන අනුව මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන්, ව්‍යාපෘති නිලධාරීන්, මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් (මානව සම්පත් සංවර්ධන නිලධාරීන්) සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සකස් කරනු ලැබේ.

එසේ වුවද, දෙපාර්තමේන්තුවේ හදිසි හා සේවා අවශ්‍යතාවය මත 2025.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අභ්‍යන්තර ස්ථානමාරු මෙමඟින් සිදු කරනු ලැබේ.

## 2. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන් පිළිබඳ විස්තර

මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්තව සියළුම දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සහ ප්‍රධාන කාර්යාලයේ සේවය කරන පහත සඳහන් තනතුරුවලට අයත් සියළුම නිලධාරීන් මෙම අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටියට යටත් වේ.

i. වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී / ව්‍යාපෘති නිලධාරී
ii. මානව සම්පත් සංවර්ධන සහකාර / සංවර්ධන නිලධාරී (මානව සම්පත් සංවර්ධන නිලධාරී)

### 2:1 සේවා ස්ථානයක සම්පූර්ණ කළ යුතු සේවා කාලය සහ ස්ථාන මාරු කිරිමේ ක්‍රමවේදය

2:1:1 තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02 ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික ස්ථාන මාරු වීම් සඳහා සුදුසුකම් ලබයි.

2:1:2 එකම සේවා ස්ථානයක් තුළ වසර 05කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

2:2:3 දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරන අතිරික්ත නිලධාරීන් අනිවාර්යෙන්ම ස්ථාන මාරු වීම් වලට යටත් වේ.

2:1:4 දැනට සේවය කරන සේවා ස්ථානයේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධරයන් ස්ථාන මාරු අපේක්ෂා නොකරන්නේ නම් එසේ කිරීමට හේතු වු විශේෂිත කරුණු ද සමඟ ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර අදාළ ස්ථාන මාරු අයදුම්පත මඟින්ම දැනුම් දිය යුතුය. (අදාළ වන විශේෂිත කරුණු මෙම පටිපාටියෙහි 5.1, 5.2 හා 5.3 යටතේ දක්වා ඇත.)

2:1:5 ස්ථාන මාරු ඉල්ලුම් කිරීමට යටත් වන නිලධාරීන් ස්ථානමාරු අයදුම්පත් නිසි කලට දෙපාර්තමේන්තුව වෙත නොඑවීමෙන් ඔවුන් රාජකාරී අවශ්‍යතාවය මත ස්ථානමාරු කරනු ලබන අතර ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට යටත් වේ.

### 2:2 ක්‍රමවේදය හා අනෙකුත් කරුණු

2:2:1 ස්ථාන මාරු අයදුම් කිරීමට සුදුසුකම් ලබන නිලධරයන් යම් සේවා ස්ථානයකට මාරු වීමට ඉල්ලා ඇති විටදී එම සේවා ස්ථානය සඳහා නිශ්චිත කාර්ය මණ්ඩලය තුළ පුරප්පාඩු නොමැති වන්නේ නම්, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා ඉහත 2.1.2 අවශ්‍යතා සම්පූර්ණ කළ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයා ඉන් පිටතට ස්ථාන මාරු කරනු ලැබේ.

2:2:2 දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරන අතිරික්ත නිලධාරීන් අතුරින් වැඩිම සේවා කාලයක් සහිත නිලධාරීන් ඉන් පිටතට මාරු කරනු ලැබේ.

2:2:3 නිලධරයන් ස්ථාන මාරු කිරීමේ දී දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනු ලැබේ.

2:2:4 යම් සේවා ස්ථානයකට ස්ථාන මාරු වීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇති විට පහත දැක්වෙන නිර්ණායක මත වඩාත් සුදුසු නිලධරයා තීරණය කරනු ඇත.

I. දෙපාර්තමේන්තුවේ ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය
II. අයදුම්කරනු ලබන සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ සේවය කර ඇති කාල සීමාව

2:2:5 මෙම ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කිරීමේදී දැනට නිලධාරීන් සේවයේ නිරත වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පුරප්පාඩු ඇති නොවන සේ ක්‍රියාත්මක කල යුතුය.

2:2:6 දැනට පුරප්පාඩු පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට හැකිතරම් දුරට නිලධාරීන් අනුයුක්ත වන සේ මෙම ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කිරීමට නියමිතය. දෙපාර්තමේන්තු අවශ්‍යතාවය මත දැනට පුරප්පාඩු පවතින සේවා ස්ථාන වලට සිදුකරන ස්ථාන මාරුවලට යටත්වන නිලධාරීන් අවම වශයෙන් වසරක (01) කාල සීමාවක් අදාල සේවා ස්ථානයේ සේවය කල යුතුය.

**2:3 සේවා කාලය ගණනය කිරීම**

2:3:1 ස්ථාන මාරුවීම් සඳහා සේවා කාල ගණනය කරනු ලබනුයේ 2024.12.31 දිනටය.
2:3:2 සේවා කාලයන් ගණනය කිරීමේ දී සේවා ස්ථානයේ සේවයට වාර්තා කල දිනය ආරම්භක දිනය ලෙස සැලකිය යුතුය.

## 03. වාර්ෂික ස්ථාන මාරු කමිටුව

3:1 ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

I. අධ්‍යක්ෂ (පාලන) - ස්ථාන මාරු මණ්ඩලයේ සභාපති
II. දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් - සමාජික
III. වෘත්තීය සමිති නියෝජිත - සමාජික
(ඉහත අංක 2 හි දැක්වෙන සේවාවන්ට අදාල වන තනතුරු දරන නිලධාරීන් අතුරින් 15% ක නියෝජනයක් සහිත සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම් කල නියෝජිතයෙක් )

**3:2** ස්ථාන මාරු මණ්ඩලයට යටත් නොවන ස්ථානමාරු.

I. සේවා අවශ්‍යතාව මත සිදු කරනු ලබන ස්ථාන මාරු කිරීම.
II. විනය නියෝග හෝ විනයානුකූල ක්‍රියාමාර්ග අවශ්‍යතාවය මත හෝ විනය හේතු මත කරන ස්ථාන මාරු කිරීම.
III. නිලධාරීන්ගේ ඉල්ලීම් මත කරන සුහද මාරු කිරීම.
IV. සේවා ස්ථානයේ වෙනසක් නොවන අභ්‍යන්තර මාරු කිරීම්.
V. සේවා අවශ්‍යතාවය මත රඳවා ගැනීම්.

**04.** **වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව**

I. අධ්‍යක්ෂ ජනරාල්
II. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
III. දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන) නොවන වෙනත් අධ්‍යක්ෂවරයෙක්
IV. ස්ථානමාරු මණ්ඩලයේ සභාපති
V. වෘත්තීය සමිති නියෝජිත

**5.1 වාර්ෂික ස්ථාන මාරු ලබාදීමේ දී සැලකිල්ලට ගන්නා පොදු කරුණු**

**5:1:1** යම් නිලධරයෙකුගේ කලත්‍රයා පොලිසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේදී ආබාධිත තත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් කළ යුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි. එසේම එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛතාවය දැක්විය යුතු වේ.

**5:1:2** සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතුය.

**5:1:3** පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන්හි වැනි පිළිගත හැකි කරුණු ඇතිව දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම්/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම පිළිබඳව සළකා බලනු ලැබේ.

**5.2 වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් නොවන නිලධාරීන්**

5.2.1 අවුරුදු 55 ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කය තුළ වෙනත් සේවා ස්ථානයකට මාරු කළ හැකි වුව ද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය.

5.2.2 2024.12.31 දිනට අවුරුදු 58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුළ වුව ද මාරු නොකල යුතුය.

**5:3 වෘත්තීය සමිති සඳහා අනුග්‍රහය**

5.3.1 කම්කරු කොමසාරිස් විසින් ලියාපදිංචි කරනු ලැබූ වෘත්තීය සංගමයක, සංවිධානයක ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා මධ්‍ය විධායක සභිකයන් මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතු වලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කළ යුතුය.

5.3.2 මෙම වගන්තියේ දැක්වෙන අනුග්‍රහ භුක්ති විඳිමට අපේක්ෂා කරන වෘත්තීය සංගමයේ නිලධරයන් ඒ සඳහා අයදුම්පත්‍රයක් පිළියෙල කර ( ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.5 උප වගන්තිය අනුව) ස්ථාන මාරු කමිටු රැස්වීමට සති දෙකකටවත් පෙර මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7:2 උප වගන්තිය අනුව අනුග්‍රහය ලබා දිය යුතු වන්නේ, කවර නිලතල වලටද යන වගත්,ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.6 උප වගන්තිය අනුව නිසි බලධරයා විසින් තීරණය කරනු ලැබේ. මේ පිළිබඳව පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

**5.4 සුහද ස්ථාන මාරුවීම්**

5.4.1 2024.09.01 දින සිට 2024.12.31 දිනයන් අතර කාලයේ දී අන්‍යෝන්‍ය ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලීම් භාරගනු නොලැබේ.

5.4.2 වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ තීරණ දැනුම් දෙන දින සිට දින 14 ක් ඇතුලත සුහද මාරු වීම් සඳහා වන ඉල්ලීම් ඉදිරිපත් කල යුතුය.

**06. ස්ථාන මාරුවීම් කාල සටහන**

ස්ථාන මාරු කමිටුව විසින් සිදුකරන වාර්ෂික ස්ථාන මාරුවීම් පහත සඳහන් කාල සටහනට අනුව සිදුවිය යුතුය.

| අංකය | කාර්යය | දිනය |
|---|---|---|
| 1 | වාර්ෂික ස්ථාන මාරු කමිටුව පිහිටුවීම | 2024 අගෝස්තු 24 වන දිනට පෙර |
| 2 | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර කැඳවීම පිළිබඳව දැන්වීම් නිකුත් කිරීම | 2024 අගෝස්තු මස 31 වන දිනට පෙර |
| 3 | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාල බලධාරියා වෙත ඉදිරිපත් කිරීම | 2024 ඔක්තෝම්බර් මස 01 වන දිනට පෙර |
| 4 | අදාළ බලධාරියා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාර දීම | 2024 ඔක්තෝම්බර් මස 05 වන දිනට පෙර |
| 5 | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාල බලධරයා වෙත ලිඛිතව භාර දීම | 2024 ඔක්තෝම්බර් මස 20 වන දිනට පෙර |
| 6 | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම | 2024 ඔක්තෝම්බර් මස 30 වන දිනට පෙර |
| 7 | ස්ථානමාරු වීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීම | 2024 නොවැම්බර් මස 15 වන දිනට පෙර |
| 8 | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාල බලධාරියා වෙත ලිඛිතව භාර දීම | 2024 නොවැම්බර් මස 20 වන දිනට පෙර |
| 9 | අවසාන ස්ථාන මාරු වීම් නියෝග නිකුත් කිරීම | 2024 නොවැම්බර් මස 30 වන දිනට පෙර |
| 10 | වාර්ෂික ස්ථානමාරු බලාත්මක කිරීම | 2025 ජනවාරි මස 01 වන දිනට පෙර |

**07. වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම.**

7.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව නිලධරයෙකු විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත අභියාචනයක් ඉදිරිපත් කල යුතු වන අතර, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වනු ඇත.

**කේ.ජී.එච්.එච්.ආර් කිරිඇල්ල**
අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

**දුරකථන අංකය : 0112187160**
**ඊ- තැපැල : kiriellaruwan@gmail.com**